# 2.25 දනගොබ ගිරි ලිපිය සහ පුරාවිද්‍යා ස්ථානය

පී. බී. ඒ. එන් ඩබ්. බණ්ඩාර
පුරාවිද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය

## ABSTRACT

පොළොන්නරුව රාජ්‍ය සමය බෞද්ධාගම අභිබවා හින්දු බලපෑම තදින් ම ලැබුණු යුගයක් ලෙස ඉතිහාසය පිරික්සීමේ දී පැහැදිලිවේ ඒ අනුව රාජ්‍ය පාලකයිනගේ මූලික කාර්යභාරය අතර බෞද්ධාගම නගා සිටුවීම ප්‍රමුඛ විය. මෙවැනි කාර්යයන් ජනතාවගේ පක්ෂග්‍රාහීභාවය ලබාගැනීමේ උපක්‍රමයක් ලෙස ද යොදගත්තා විය හැකිය. පූජනීය ස්ථාන ගොඩනැගීමේ දී රජුන් අග නගරය කෙරෙහි පමණක් නොව ප්‍රත්‍යන්ත ප්‍රදේශ කෙරෙහිද අවදානය යොමු කළ බව දනගොබ වැනි පරිධියේ පිහිටි පුරාවිද්‍යාත්මක ස්ථාන තුළින් පැහැදිලි වේ.

මාතලේ දිස්ත්‍රික්කයේ හබරණ ත්‍රිකුණාමලය මහා මාර්ගයේ සිව්වන සැතපුම පසුකොට කිලෝමීටර් භාගයක් පමණ ගිය පසු වම්පසින් මෙකී පුරාවිද්‍යා ස්ථානය දකින්නට ලැබේ. උසින් අඩි 100 ක් පමණ පැතිරුණ ගල් තලාවේ අනාවරණය වී නොමැති 12 වන සියවසට අයත් අක්ෂර සහිත ගිරි ලිපියක් සහ අවට තැන තැන විසිරුණු ගඩොල් කැබලි, ගල් කණු කොටස් මෙන් ම චෛත්‍යයක නටබුන් යැයි සිතිය හැකි පස් ගොඩැල්ලක සාධක දක්නට හැකිය. අද්‍යතනයේ බෙහෙවින් ම නිදන් හොරුන්ගේ ආධිපත්‍යයට මෙන් ම වාණිජකරණයට හසු වූ මෙම පුරාවිද්‍යා ස්ථානය හා ගිරි ලිපිය පිළිබඳ තොරතුරු අනාවරණය කිරීම මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් සිදුවේ.